මහනුවර නාගරික අපජල කළමනාකරණ ව්‍යාපෘතිය - 2020
-----------------------------------------------------------------

මහනුවර නාගරික අපජල කළමනාකරණ ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය අතර 2010 මාර්තු 26 දින එළඹි අංක එස්එල්-පී 99 දරන ණය ගිවිසුමේ III ව්‍යවස්ථාවේ 4(6) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතුයැයි සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට නගර සැලසුම් හා ජලසම්පාදන අමාත්‍යාංශය, වර්තමානයේ ජලසම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මහනුවර නගරයේ අපජලය රැස් කිරීම, පිරිපහදු කිරීම හා බැහැර කිරීම සඳහා යෝග්‍ය ක්‍රමවේදයක් ගොඩනැංවීම මගින් ජනාකීර්ණ ප්‍රදේශ වල සනීපාරක්ෂක පහසුකම් යළි නගා සිටුවීම, මහවැලි ගඟේ ජලයේ ගුණත්වය හා ජීවන පරිසරය උසස් කිරීම හා ඒ අනුව ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය, සෞඛ්‍ය හා සුබ සාධනය ඉහල නැංවීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 21,982 කට සමාන ජපන් යෙන් මිලියන 17,278 ක් වන අතර, ඉන් රු.මිලියන 17,922 කට සමාන ජපන් යෙන් මිලියන 14,087 ක් සැපයීමට ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය එකඟ වී තිබුණු අතර ඉතිරි මුදල වූ රු.මිලියන 4,060 කට සමාන ජපන් යෙන් මිලියන 3,191 ක් ශ්‍රී ලංකා රජය විසින් සැපයීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 පෙබරවාරි 03 දින ආරම්භ කර තිබුණු අතර 2017 සැප්තැම්බර් වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව ව්‍යාපෘති කාලය 2022 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 02 වගුවේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශව විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

--------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2.** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.1** **ගිණුම්කරණ අඩුපාඩු**

| ගිණුම්කරණ අඩුපාඩු | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණනකගේ නිර්දේශ |
| --- | --- | --- |
| (අ) ජාතික ජල ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ කෙරී ගෙන යන වැඩ වටිනාකම රු.මිලියන 17,232 ක් විය. කෙසේ වුවද, ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන අනුව කෙරීගෙන යන වැඩ වටිනාකම රු.මිලියන 16,783 ක් විය. හඳුනා ගන්නා ලද වෙනස වූ රු.මිලියන 449 සඳහා ව්‍යාපෘතිය විසින් සැසඳුම් ප්‍රකාශ සකස් කර තිබුණ ද, එම වෙනස නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | ණය ගිවිසුම් අංක එස්එල්-පී 90 හා එස්එල්-පී 99 යටතේ වූ ව්‍යාපෘතිවල කෙරී ගෙන යන වැඩ වටිනාකම හා 2018 සැප්තැම්බර් 30 ට පෙර දරන ලද වියදම් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති කෙරී ගෙන යන වැඩ වටිනාකම වූ රු.මිලියන 17,232 තුළ අන්තර්ගත වේ. | වෙනස නිරාකරණය කිරීමට ක්‍රියා මාර්ග ගත යුතුය. |
| (ආ) 2020 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 387 ක් වූ ව්‍යාපාතියේ මුළු වැටුප් වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දේශීය අරමුදල් මූල්‍යන ප්‍රභවය යටතේ දක්වනවා වෙනුවට ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි. | 2020 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 387ක් වූ ප්‍රධාන කාර්යාලයෙන් ගෙවන ලද කාර්ය මණ්ඩල වැටුප නැවත ප්‍රධාන කාර්යාලයට ගෙවිය යුතු වේ. එම නිසා ගෙවිය යුතු වියදමක් ලෙස ගිණුම්ගත කරන ලදී. | මූල්‍යන ප්‍රභවය යටතේ ගිණුම් තැබීමට ක්‍රියා මාර්ග ගත යුතුය. |

## 3. භෞතික කාර්ය සාධනය

## 3.1 ව්‍යාපෘතියේ කාර්යන්වල භෞතික ප්‍රගතිය

| | 2020 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය – අපේක්ෂිත කාර්යසාධන | 2020 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය – සත්‍ය කාර්යසාධන | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- | --- | --- |
| (අ) නිර්මාණ හා සැලසුම් කිරීම් | | | භූමියේ දුෂ්කර බව හා දැඩි මාර්ග තදබදය ප්‍රමාදයට හේතු විය. නිරීක්ෂණය වූ කොන්ත්‍රාත්කරුගේ ප්‍රමාදය සඳහා ඇවර කිරීමේ ගාස්තු (එල්.ඩී) අය කිරීමට දැනුම් දෙන ලදී. නමුත් ඩීඒබී තීරණය මත ඇවර කිරීමේ ගාස්තු අය කළ නොහැකි අතර 2021 දෙසැම්බර් වන විට කටයුතු නිම කිරීමට කොන්ත්‍රාත්කරු එකඟ විය. | කොන්ත්‍රාත් කාර්යය කඩිනම් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| - ප්‍රධාන අපවහන ජාලය | | | | |
| කාණු සහිත (Open Cut) | කි.මී.6.23 | කි.මී.4.5 | | |
| කාණු රහිත (Trenchless) | කි.මී.2.87 | කි.මී.2.65 | | |
| - ශාඛා අපවහන ජාලය | | | | |
| කාණු සහිත (Open Cut) | කි.මී.71.1 | කි.මී.65.3 | | |
| කාණු රහිත (Trenchless) | කි.මී.5.7 | කි.මී.0. 82 | | |
| - ගෘහස්ථ අපවහන ජාලය | | | | |
| කාණු සහිත | කි.මී.145.2 | කි.මී.141 | | |

| | | | | |
|---|---|---|---|---|
| කාණු රහිත | කි.මී.11.24 | කි.මී.1.8 | | |
| -ප්‍රධාන නලය | | | | |
| කාණු සහිත (Open Cut) | කි.මී.3.18 | කි.මී.2.93 | | |
| කාණු රහිත (Trenchless) | මීටර 173 | මීටර 17 | | |
| - මනු බිල් පොම්ප මධ්‍යස්ථානය (Manhole pump station) | 9 | 03 ක් ක්‍රියාත්මක අතර 06 ක් කෙරෙමින් පවතී. | | |
| (ආ) ගෘහස්ථ සම්බන්ධතා ඉදිකිරීම් | | | කොන්ත්‍රාත්කරුගේ කාර්ය සාධනය මත අයිපීසී ප්‍රමාද විය. වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත. | කාර්යය කඩිනම් කිරීමට ක්‍රියා මාර්ග ගත යුතුය. |
| - ඉදි කිරීම | 6,191 | 4,470 | | |
| - සම්බන්ධතා ලබා දීම | 3,297 | 971 | | |

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණනකගේ නිර්දේශ |
|---|---|---|
| (අ) ව්‍යාපෘතිය අවසාන නොවුවද, ණය ආපසු ගෙවීම් **2020** වර්ෂයේ ආරම්භ කර තිබුණි. විදේශ සම්පත් දෙපාර්තමේන්තුව අනුව කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යය සාධනය හා කොන්ත්‍රාත් නියමිත වෙලාවට ප්‍රධානය කිරීම ප්‍රමාද වීම මත **2020** දෙසැම්බර් **31** දින වන විට ණය ආපසු අය කර ගැනීම් ලෙස රු.මිලියන **803.40** ක් ණය නියෝජිතායතනයට ගෙවා තිබුණි. | කළමනාකරණයේ අදහස් ලැබී නොමැත. | ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන ලෙස ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ප්‍රමාදයකින් තොරව ව්‍යාපෘති කාර්යය සාධනය කඩිනම් කිරීම සඳහා ක්‍රියාමර්ග ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) දුර්වල ව්‍යාපෘති කළමණාකරණය සහ එකඟ වූ කාල රාමුව තුළ ණය උපයෝජනය සිදු නොකිරීම නිසා 2020 දෙසැම්බර් 31 දින දක්වා බැඳීම් ගාස්තු ලෙස රු.මිලියන 165.32 ක් ණය නියෝජිතායතනය විසින් අය කර තිබුණි. | කළමනාකරණයේ අදහස් ලැබී නොමැත. | -එම- |

**3.3 පරිබාහිර කටයුතු**

-----------------

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණනකගේ නිර්දේශ |
|---|---|---|
| ව්‍යාපෘති විෂය පථයට පරිබාහිර වූ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ අපජල අපහරණ පිරියත ඉදි කිරීම වෙනුවෙන් ව්‍යාපෘතියේ දේශීය අරමුදල මඟින් රු.288,000 ක් දරා තිබුණි. | 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන මඟින් මෙය නිවැරදි කරනු ඇත. | ව්‍යාපෘති විෂය පථය තුළ වියදම් සිදු කිරීමට කටයුතු කළ යුතුය. |

**3.4 මතභේදයට තුඩු දෙන කරුණු**

-------------------------------

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණනකගේ නිර්දේශ |
|---|---|---|

| | | |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු එකතු කළ අගය මත බදු වටිනාකම (වැට්) සහ ජාතිය ගොඩ නැගීමේ බදු (එන්බීටී) වටිනාකම පිළිවෙලින් රු.මිලියන 55.52 සහ රු.මිලියන 7.5 ක් විය. කෙසේ වුවද , පිළිවෙලින් රු.මිලියන 49.64 ක් හා රු.මිලියන 7.5 ක් වූ වැට් සහ එන්බීටී දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය නොකොට ව්‍යාපෘතිය විසින් රඳවා ගෙන තිබුණි. | භාණ්ඩාගාරමෙහෙයුම් දෙපාර්තමේන්තුවේ ලිපි යොමු අංක ටීඔ/බීඊ03/05/01/03 (2011-166) මගින් රු.34,316,472.23 ක් නිරවුල් කර ඇති අතර ඉතිරි වටිනාකම 2021 වර්ෂය තුළ නිරවුල් කරනු ඇත. | ප්‍රමාදයකින් තොරව ඉතිරි වටිනාකම නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.5 පද්ධති හා පාලන

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| (අ) මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතියේ ගනුදෙනු අභ්‍යන්තර විගණන අංශය විසින් විගණනය කිරීමට කටයුතු කර නොතිබුණු අතර 2016 ජුනි කලමනාකරණ විගණන චක්‍ර ලේඛ අංක 02/2016 පරිදි අභ්‍යන්තර විගණනකවරයෙක් බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අභ්‍යන්තර විගණකවරු බඳවා ගැනීම සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යාලය කටයුතු කරයි. 2019 වර්ෂයේ අභ්‍යන්තර විගණකවරු විසින් අදාල ලියවිලි ඉල්ලා ඇති අතර ඒවා අභ්‍යන්තර විගණන අංශයට සපයා ඇත. | අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කිරීමට ක්‍රියා කළ යුතුය. |

## 3.6 පෙර විගණන වාර්තාවලින් පෙන්වා දෙන ලද නොවිසඳුනු ගැටළු

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ඉදිකිරීම් කරන ලද දෙයියන්වෙල පොම්පාගාර සහිත ඉඩමේ සහ පොම්පාගාරයේ ඉදි කිරීම් කරමින් පවතින දෙයියන්වෙල පොම්පාගාරයේ ඉදි කිරීම් නිම කර ඇති අතර මහාමයා ප්‍රාථමික විද්‍යාලයට ආසන්න පොම්පාගාරයේ ඉදිකිරීම් කෙරෙමින් පවතී.කෙසේ වුවද, ඉඩම්වල අයිතිය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට පවරා ගෙන නොතිබුණි. | ප්‍රධාන පොම්පාගාරය පිහිටි ආලෝක රෝහල් පරිශ්‍රයේ අතිරේක ඉඩම අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියේ පවතී. මනු බිල් පොම්පාගාරය පිහිටි මහමායා ප්‍රාථමික විද්‍යාල පරිශ්‍රය වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් අතර දෙයියන්වෙල මනුබිල් පොම්පාගාරය පරිශ්‍රය රාජකීය ඉඩමකි. | තව දුරටත් ප්‍රමාදවීමකින් තොරව ඉඩම්වල අයිතිය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත පවරා ගැනීමට ක්‍රියා මාර්ග ගත යුතුය. |